# දිස්ත්‍රික්ක / පළාත අනුව රැකියාගත වීම



මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

පි.ඩබ්.චතුරිකා චන්ද්‍රසේන

සංවර්ධන නිලධාරි

හැඳින්වීම

## 01.සේවා නියුක්තිය

අදාළ යොමු කාලය තුළ, වැටුප් ලබන සේවකයින්, සේවා යෝජකයින්, තමාගේ ආර්ථික කටයුතුවල නිරතවන්නන් හා පවුලේ ආර්ථික කටයුතුවලට දායක වන්නන් රැකියා නියුතු ලෙස සැලකේ. රැකියාවක් ඇති පුද්ගලයින් තාවකාලික හේතු මත ආදාළ යොමු කාලය තුළ රැකියාවේ නිරත නොවුවද ඔවුන්ද මේ යටතට ගැනේ.

ශ්‍රම බල සමීක්ෂණයන් අනුව සමීක්ෂණය සඳහා තොරතුරු ලබා ගන්නා දිනට පෙර සතිය තුළ අවම වශයෙන් එක් දිනක් හෝ වේතනයකට හෝ ලාභයකට හෝ පවුලේ ආර්ථික වර්ධනයට වැඩ කළ අය හා වැඩෙහි නිරත නොවුවන් මෙම කාලය තුළ නිරත වීමට වැඩ කළා යැයි ගණන් ගැනීමට ඔහු එම දින තුළ පැය තුනකට නොවැඩි කාලයක් වැඩ කල යුතු විය. සාපේක්ෂ වශයෙන් ඉතා අඩු වයසැති පුද්ගලයින් පවා ගෙවීමක්, ලාභයක් හෝ පවුලේ වර්ධනයට වැඩ කරන හෙයින් යම් කිසි වයස් මට්ටමකට අඩු එහෙත් රැකියාවක නිරත වූ  අයද සේවා නියුක්ති ගණයට වැටේ.

## 02. දිස්ත්‍රික් අනුව රැකියාගත අනුපාතය

වගුව. 01

| දිස්ත්‍රික්කය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | කෘෂි කර්මාන්ත | කර්මාන්ත | සේවා | කෘෂි කර්මාන්ත | කර්මාන්ත | සේවා |
| කොළඹ | 1.6 | 28.2 | 70.2 | 2.7 | 28.4 | 69.0 |
| ගම්පහ | 4.4 | 37.4 | 58.2 | 3.5 | 35.8 | 60.7 |
| කළුතර | 13.7 | 31.1 | 55.1 | 15.8 | 32.9 | 51.4 |
| මහනුවර | 20.1 | 28.4 | 51.5 | 20.7 | 26.8 | 52.5 |
| මාතලේ | 30.3 | 25.2 | 44.4 | 37.0 | 25.7 | 37.3 |
| නුවර එළිය | 51.2 | 24.9 | 23.9 | 52.4 | 24.3 | 23.3 |
| ගාල්ල | 25.6 | 31.5 | 42.9 | 27.2 | 27.7 | 45.1 |
| මාතර | 31.6 | 25.0 | 43.3 | 30.9 | 25.0 | 44.1 |
| හම්බන්තොට | 29.0 | 28.3 | 42.7 | 30.3 | 29.7 | 40.1 |
| යාපනය | 22.2 | 24.1 | 53.8 | 24.8 | 24.1 | 51.1 |
| මන්නාරම | 43.9 | 18.3 | 37.8 | 45.7 | 18.9 | 35.4 |
| වව්නියාව | 30.9 | 23.5 | 45.6 | 20.3 | 28.4 | 51.3 |
| මුලතිව් | 47.4 | 18.2 | 34.4 | 44.5 | 21.5 | 34.0 |
| කිළිනොච්චිය | 34.8 | 26.2 | 39.0 | 33.8 | 24.6 | 41.6 |
| මඩකලපුව | 30.9 | 28.9 | 40.2 | 28.9 | 27.2 | 43.9 |
| අම්පාර | 31.2 | 22.9 | 45.9 | 26.3 | 25.4 | 48.3 |
| ත්‍රිකුණාමලය | 24.6 | 20.8 | 54.5 | 26.3 | 21.5 | 52.2 |
| කුරුණෑගල | 28.6 | 30.8 | 40.6 | 24.3 | 33.7 | 42.0 |
| පුත්තලම | 23.7 | 32.0 | 44.3 | 30.7 | 30.4 | 38.9 |
| අනුරාධපුරය | 46.7 | 15.7 | 37.6 | 44.6 | 17.6 | 37.9 |
| පොළොන්නරුව | 41.7 | 17.9 | 40.4 | 39.1 | 23.3 | 37.6 |
| බදුල්ල | 55.4 | 11.0 | 33.6 | 52.2 | 15.5 | 32.3 |
| මොණරාගල | 48.6 | 16.0 | 35.4 | 52.3 | 15.1 | 32.7 |
| රත්නපුර | 39.6 | 28.7 | 31.7 | 41.4 | 26.7 | 32.0 |
| කෑගල්ල | 23.6 | 33.4 | 43.0 | 24.7 | 37.1 | 38.2 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව- 2018/ 2020

ප්‍රස්ථාරය 1




මුලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2019

2019 වර්ෂයේ දිස්ත්‍රික්ක අනුව රැකියාගත අනුපාතය සලකා බැලූ විට සේවා අංශයේ කොළඹ දිස්ත්‍රික්කය වැඩි බවක් දක්නට ලැබේ. එය 70.2 කි.

02.ප්‍රස්ථාරය




මුලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව- 2018

2018 වර්ෂයේ දිස්ත්‍රික්ක අනුව රැකියාගත අනුපාතය සලකා බැලූ විට සේවා අංශයේ කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිම අගයක් පෙන්නුම් කරයි. එය 69 කි.

## 03.පළාත අනුව රැකියාගත ජනගහන අනුපාතය - 2019

03.ප්‍රස්ථාරය




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව -2019

2019 වර්ෂයේ රැකියාගත ජනගහනය පළාත අනුව හා අංශ අනුව සලකා බැලූ විට බස්නාහිර පළාතේ සේවා අංශයේ වැඩි අගයක් ගනි. එය 62.4 කි. දෙවනුව වැඩිම රැකියාගත ජනගහනය ඌව පළාතේ කෘෂිකර්ම අංශය නියෝජනය කරයි.

## 04. පළාත අනුව රැකියාගත ජනගහන  අනුපාතය- 2018

04-ප්‍රස්ථාරය




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2018

2018 වර්ෂයේ රැකියාගත ජනගහන අනුපාතය පළාත අනුව සලකා බැලූ විට සබරගමු පළාතේ කෘෂිකර්මාන්ත අංශය ඉහළ අගයක් ගනී. එය 62.1 කි. 52.2 වශයෙන් මධ්‍යම පළාතේ සේවා අංශය දෙවන ස්ථානයට පත්ව ඇත.

## නිගමන

- ✓ 2018 හා 2019 වර්ෂ සැලකිමේදි වැඩිම රැකියාගත අනුපාතය කොළඹ දිස්ත්‍රික්කයේ සේවා අංශයෙන් වන අතර එය පිළිවෙලින් 69 සහ 70.2 කි.
- ✓ 2019 වර්ෂයේ ගම්පහ, මාතර, කිලිනොච්චි, මඩකලපුව, අම්පාර, කුරුණෑගල, අනුරාධපුර,පොළොන්නරුව, බදුල්ල, රත්නපුර, වවුනියාව, මුලතිව් කෘෂිකර්මාන්ත අංශයේ දිස්ත්‍රික් අනුව රැකියාගත අනුපාතය වැඩි වි ඇත.
- ✓ ගම්පහ, මහනුවර, නුවර එළිය, ගාල්ල, කිලිනොච්චිය, මඩකලපුව, පුත්තලම, මොණරාගල, රත්නපුර 2019 වර්ෂයේ කර්මාන්ත අංශයේ දිස්ත්‍රික් අනුව රැකියාගත අනුපාතය වැඩි වි ඇත.
- ✓ 2018 සහ 2019 වර්ෂ දෙකෙහි යාපනය, මාතර දිස්ත්‍රික්ක දෙකෙහි රැකියාගත අනුපාතය වෙනසක් සිදු වි නැත.
- ✓ කොළඹ, කළුතර, මාතලේ, නුවර එළිය, හම්බන්තොට, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, පුත්තලම, බදුල්ල, මොණරාගල, කැගල්ල දිස්ත්‍රික්කයන්හි 2019 වර්ෂයේ සේවා අංශයේ රැකියාගත අනුපාතය වැඩි වි ඇත.
- ✓ ගම්පහ, මහනුවර,ගාල්ල,මාතර, වවුනියාව, කිලිනොච්චිය, මඩකලපුව, අම්පාර, කුරුණෑගල, අනුරාධපුර, රත්නපුර දිස්ත්‍රික්කයන්හි 2018 වර්ෂයේ සේවා අංශයේ රැකියාගත අනුපාතය වැඩි වි ඇත.
- ✓ පළාත අනුව රැකියාගත ජනගහන අනුපාතය සැළකිමේදි 2018 වර්ෂයේ කෘෂිකර්මාන්ත අංශයෙන් වැඩිම ප්‍රමාණය බස්නාහිර, මධ්‍යම, දකුණ, උතුර, නැගෙනහිර, වයඹ, සබරගමුව වාර්තා වි ඇත.
- ✓ 2019 වර්ෂයේ කෘෂිකර්මාන්ත අංශයෙන් උතුරු මැද, ඌව පළාත් දෙකෙහි රැකියාගත අනුපාතය වැඩි වි ඇත.
- ✓ 2018 වර්ෂයේ කර්මාන්ත අංශයෙන් වැඩිම රැකියාගත ජනගහනය වාර්තා වන්නේ උතුර, නැගෙනහිර, උතුරු මැද, ඌව, සබරගමුව පළාත් වලිනි. එමෙන්ම 2019 වර්ෂයේ බස්නාහිර, මධ්‍යම, දකුණ, වයඹ පළාත්වල රැකියාගත ජනගහනය වැඩි වි ඇත.
- ✓ 2018 වර්ෂයේ සේවා අංශයේ වැඩිම රැකියාගත ජනගහනය මධ්‍යම පළාත වන අතර 2019 වර්ෂයේ බස්නාහිර, දකුණ, උතුර, නැගෙනහිර, වයඹ, උතුරු මැද, ඌව, සබරගමු පළාත්වල රැකියාගත ජනගහනය වැඩි වි ඇත.